**ශීර්ෂය 308-තැපැල් දෙපාර්තමේන්තුව**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**-----------------------------------**

තැපැල් දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තැපැල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව තැපැල් දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 සැප්තැම්බර් 01 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට තැපැල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**--------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

**-----------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

--------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහා භාණ්ඩාගාරයේ කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයාට අනුව හා මූල්‍ය ප්‍රකාශන අනුව නොනිමි වැඩ, ප්‍රවාහන උපකරණ, වෙනත් යන්ත්‍ර උපකරණවල හා කල්බදු වාහනවල ආරම්භක ශේෂවල පිළිවෙලින් රු.62,399,823 ක, රු.38,770,000 ක, රු.40,950,210 ක හා රු.10,783,801 ක වෙනසක් විය. | විගණන නිරීක්ෂණය පිළිගනිමි.<br><br>2021 මූල්‍ය ප්‍රකාශනය සැකසීමේදී කොම්ප්ටෝලර් ජනරාල් යටතේ පෙන්නුම් කරන වත්කම් ශේෂයන් උපයෝගී කරගැනීමට සටහන් කර ගතිමි. | මූල්‍ය නොවන වත්කම් ශේෂය දෙපාර්තමේන්තු පොත් අනුව හා භාණ්ඩාගාර පොත් අනුව සැසඳිය යුතුය. |
| (ආ) | භාණ්ඩාගාර පොත් අනුව හා මූල්‍ය ප්‍රකාශන අනුව වෙනත් යන්ත්‍ර හා උපකරණවල අවසාන ශේෂවල රු.304,582 ක වෙනසක් විය. | එම විගණන නිරීක්ෂණය නිවැරදි වුවද අවසන් පරිපූරක ගිණුම් සාරාංශය භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව වත්කම් ශේෂයන් පැවති ආකාරයට මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. එමෙන්ම එම අගයන් දෙපාර්තමේන්තු පොත් අනුව නිවැරදි අගය වේ. භාණ්ඩාගාර මුද්‍රිත සටහන් ඉදිරිපත් කිරීමේදී භාණ්ඩාගාරය විසින් දෙපාර්තමේන්තුව වෙත වාචිකව හෝ ලිඛිත දැනුම්දීමක් සිදු නොකර වත්කම් ශේෂ වෙනස් කර ඇත. රු.304,583 ක අගය භාණ්ඩාගාර පොත් සමඟ ගැලපීම් සිදු කිරීමට නැවත භාණ්ඩාගාරය වෙත 2021.03.08 දින පැවරීම් පත්‍රයක් ඉදිරිපත් කර ඇත. | මූල්‍ය නොවන වත්කම් ශේෂය දෙපාර්තමේන්තු පොත් අනුව හා භාණ්ඩාගාර පොත් අනුව සැසඳිය යුතුය. |

**1.6.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දිසා ගිණුම් කාර්යාල 02ක කේවල ණය ශේෂ එකතුව සහ පාලන ගිණුමේ ශේෂය අතර රු.2,812,091 ක හඳුනා නොගත් අසමානතාවන් පවතින අතර එක් දිසා ගිණුම් කාර්යාලයක වර්ෂ 08 ක සිට පවතින රු.1,295,400 ක මූල්‍ය වංචාවක්ද මේ සඳහා හේතු වී තිබුණි. | අනුරාධපුර දිසා ගිණුම් කාර්යාලයේ රු.1,900,030 ක වෙනස පරීක්ෂා කරමින් පවතින අතර කළුතර මූල්‍ය වංචාවට අදාළව රු.149,550 ක මුදලක් විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගෙන ඇත. ගිණුම්කරණ දෝෂ මුදලින්, රු.4,612 ක් නිවැරදි කර ඇති අතර මහනුවර කාර්යාලයේ නිලධාරීන්ගෙන් වැඩිපුර අය වී ඇති රු.20,857 ක මුදල 2021.04.20 දින වන විට නිරවුල් කර ඇත. | කේවල ණය ශේෂය හා පාලන ගිණුමේ ශේෂ සමාන විය යුතුය. |

**6.3 අනුමත නොකළ ගනුදෙණු**

**ආදායම් ලැබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදලින් ආපසු ගෙවීම් හා වැරදි නිවැරදි කිරීම් රු.11,982,166 න් රු.2,406,345 ක් සඳහා පමණක් අනුමැතිය ලැබී තිබුණි. | අනුමැතිය ලබා දී නොමැති ආපසු ගෙවීම් රුපියල් 10,491,913 ක මුදලට හේතු වී ඇත්තේ ජාත්‍යන්තර ගිණුම් අංශය මුදලින් කරන ලද හර කිරීමකදී පසුව රුපියල අවප්‍රමාණය වීම නිසා වසර තුළ සිදු වූ රු.7,251,846 ක මුදල සහ ඉතිරිය වන රු.3,241,067 ක මුදල දිසා ගිණුම් කාර්යාල විසින් හරස් සටහන් මගින් වසර තුළ සිදුකරනු ලැබූ නිවැරදි කිරීම් වේ. | සියළු ආපසු ගෙවීම් හා වැරදි නිවැරදි කිරීම් සඳහා අනුමැතිය ලබා ගත යුතු වේ. |

**1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | යාවත්කාලීන කරගෙන යමින් පවතී. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 341 ප්‍රකාරව උප පත්‍රිකා ලේඛනයක් පවත්වා නොතිබුණි. | -එම- | මුදල් රෙගුලාසි 341 හි ජී.ඒ.එන් 20 ආකෘතිය ප්‍රකාරව උප පත්‍රිකා පොත් ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | -එම- | මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛනයක් පවත්වා ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 අග්‍රිම කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |

**2.2 ආදායම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |

| | | | |
|---|---|---|---|
| (අ) | රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී ආදායම් සංකේතයට අයත් ගොඩනැගිලිවලින් සංචාරක බංගලා හෝ නිවාඩු නිකේතනවලින් සමාලෝචිත වර්ෂයේ ලද රු.809,795 ක ආදායම ලේකම්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ගෙවිය යුතු වුවත් එම මුදල තැපැල්පති ආදායමට ගෙන තිබුණි. | නිවාඩු නිකේතන ප්‍රතිසංස්කරණය, අලුත්වැඩියාව, නඩත්තු වියදම් සහ කාර්ය මණ්ඩලය සඳහා ගෙවීම් ආදී සියලුම වියදම් තැපැල් දෙපාර්තමේන්තුව විසින් දරනු ලබන බැවින් එපරිදි කටයුතු කර නැති බව දන්වා සිටිමි. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කළ යුතුය. |
| (ආ) | 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලයට අදාල හිඟ ආදායම් ශේෂ එකතුව රු.95,731,166 ක් විය. | ජාත්‍යාන්තර තැපැල් සංගමයේ ගිණුම් රෙගුලාසි අනුව ආදායම් රැස්කිරීමට සිදුවීම, covid- 19 හේතුවෙන් ප්‍රමාදවීම හා ව්‍යාපාරික ආයතනයක් ගිනිගැනීම මේ සඳහා හේතු වූ අතර හිඟ ව්‍යාපාරික තැපැල් ආදායම කොටස් වශයෙන් මේ වනවිට රැස්කිරීමට කටයුතු කර ඇත. | හිඟ ආදායම් එකතු කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුයි. |

## 2.3 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධි ප්‍රතිපාදන ලබාගැනීම හේතුවෙන් ප්‍රාග්ධන වැය විෂයයන් 05 ක හා පුනරාවර්තන වැය විෂයයන් 04 ක ඉතිරිය රු.214,266,500 ක් වූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 25 සිට සියයට 97 දක්වා වූ පරාසයක පැවතුණි. | රට තුළ පැවති කොවිඩ් 19 තත්ත්වය නිසා විදේශ ගමන් නැවැත්වීම, ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාදවීම, ඉදිකිරීම් ප්‍රමාදවීම හා පුහුණුවීම් නොපැවැත්වීම මෙන්ම අයවැය ප්‍රතිපාදන සීමා කිරීමද මේ සඳහා හේතු වී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි ඇස්තමේන්තු සකස් කළ යුතුය. |

## 2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගනිමි.<br><br>මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර ගැනීමට ක්‍රියාමාර්ග 08 ගත් බව කාරුණිකව දන්වා සිටින අතර මූල්‍ය පාලනය විධිමත් කිරීමට ගනු ලැබූ තීරණයන් අනුව අභ්‍යන්තර පාලන පද්ධතීන්හි වෙනස් කිරීමට ගනු බලන පියවරයන් පිළිබඳවත් අදාළ වෙනස් කිරීම් සිදු කරන අවස්ථාවේදීම විගණකාධිපති දැනුවත් කිරීමට කටයුතු කරන බවත් කාරුණිකව දන්වා සිටිමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ දැනට සේවයේ නියුක්ත නිලධාරීන්ගෙන් හැර ස්ථාන මාරුවී ගිය, මියගිය, විශ්‍රාමික, වැඩ තහනම් කළ, සේවය හැරගිය සහ වෙනත් නිරවුල් නොවූ ණය ශේෂවල එකතුව රු. 56,821,051 ක් වූ අතර රු.23,702,101 ක් වර්ෂ 05 කට අධික කාලයක සිට පවතින ණය ශේෂ වේ. | විශ්‍රාමික නිලධාරීන්ගේ ණය ශේෂ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන ලද පසු නිරවුල් කිරීමටත් වැඩ තහනම් නිලධාරීන්ගේ ණය ශේෂ විමර්ශන නිලධාරීන්ගේ හිඟයක් පැවතීම සහ ගතවන කාලය වැඩි වීම හේතුවෙන් එම කටයුතු අවසන් නොවීමත් වැඩ තහනම් නිලධාරීන්ගේ සහ සේවය හැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කිරීමත් සිදුවෙමින් පවතී. වසර 05 කට වැඩි ණය ශේෂවලින් රු.146,791 ක් 2021 මාර්තු අයකර ගෙන ඇත. ඉතිරි ශේෂ අයකර ගැනීමට හෝ කපාහැරීමට හෝ කටයුතු කරමින් පවතී. | ණය ශේෂ නිරවුල් කිරීමට කඩිනමින් ක්‍රියා කළ යුතුය. |

## 2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති ,රීති හා රෙගුලාසිවලට යොමුව | | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIVපරිච්ඡේදයේ 4.5 වගන්තිය | 15,776,735 | රජයට අයවිය යුතු ණය මුදල් ණයකරුවන්ගෙන් අයකර ගත නොහැකි අවස්ථාවලදී ඔහු සම්බන්ධයෙන් නියම කර ඇති ක්‍රියාමාර්ග ඇපකරු සම්බන්ධයෙන් අනුගමනය කර මුදල් අයකර ගත යුතු නමුත් වසර 05 කට වැඩි කාලයක සිට ණය ශේෂ පැවතුණි. | ඇපකරුවන් සිටින ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කරන ලෙස ලිපි මඟින් සියළුම නිලධාරීන් දැනුවත් කර ඇත. ඇපකරුවන් නොමැති ණය ශේෂ පවතී. ඇතැම් නිලධාරීන් අපගේ ලිපි සඳහා ප්‍රතිචාර දක්වා නොමැති අතර නිලධාරීන් කිහිප දෙනෙකු මේ වන විට සම්පූර්ණ මුදල හෝ කොටස් වශයෙන් ගෙවීමට එකඟ වී ගෙවීම් කරනු ලබයි. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (ආ) | මුදල් රෙගුලාසි 110 හා 102 | 4,584,188 | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වාහන අනතුරු 35 ක අලාභ වටිනාකම හානි හා පාඩු ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. | 2020 වර්ෂයට අදාල අනතුරු විස්තර යාන්ත්‍රික ඉංජිනේරු අංශයෙන් තැපැල් ප්‍රවාහන අංශය වෙත මෙතෙක් එවා නොමැති අතර 2020 වර්ෂයේ අනතුරුවල අළුත්වැඩියා කටයුතු හා රක්ෂණ මුදල් බේරුම් කිරීමේ කටයුතු අවසන් වී නොමැති වීම සඳහා හේතු වී ඇත. | මුදල් රෙගුලාසි 110 හා 102 ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | 2018 ජුලි 26 දිනැති අංක 3/2018 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | - | දෙපාර්තමේන්තුවේ අක්‍රිය බැංකු ගිණුමක් සම්බන්ධයෙන් චක්‍රලේඛ අනුව කටයුතු කර නොතිබුණි. | අංක 045-1001-1-9027341 දරන බැංකු ගිණුම වසා දැමීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සමඟ අවශ්‍ය කටයුතු සිදුකර ගෙන යනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය මාර්ගෝපදේශ 5.3.1.(ඇ) | 5,254,686 | ලංසු ලේඛන තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව විසින් පරීක්ෂා කොට අනුමත කළ යුතු නමුත් වායුසමීකරණ යන්ත්‍ර හා ටයර් මිලදී ගැනීමේදී එපරිදි කටයුතු කර නොතිබුණි. | මේ සඳහා අනුගමනය කරනු ලැබූවේ වෙළඳපල මිල සැඳහුම් ක්‍රමයයි. මින් ඉදිරියට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.1 (ඇ) වගන්ති ප්‍රකාරව කටයුතු කරන බව දන්වා සිටිමි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.7 බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන කාර්යාලයේ අංක 9027330 දරන බැංකු ගිණුමේ 2008 වර්ෂයේ සිට පැවත එන රු.50,000 ක හඳුනා නොගත් ගෙවීම් හඳුනා ගැනීමට 2020 දෙසැම්බර් 31 දින දක්වා අපොහොසත් වී තිබුණි. | මේ සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙතින් විමසන ලද අතර මු.රෙ.486 (4) අනුව කටයුතු කරන ලෙස දන්වා සිටින ලදී. ඒ අනුව කමිටුවක් පත්කර නිරීක්ෂණ හා නිර්දේශ ලබාදෙන ලෙස අධිකාරි - ම.තැ.හු. වෙත ලිපි ඉදිරිපත් කර ඇත. | හඳුනා නොගත් ගෙවීම් හඳුනා ගෙන සුදුසු පරිදි කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ සඳහන් අවුරුදු 05 සිට 10 දක්වා කාල පරාසයකට අයත් රු.14,171,700 ක වටිනාකමක් සහිත හානි හා පාඩු කපාහැරීමට හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තැපැල් කාර්යාල 03 ක අලාභයන් කපා හැරීම සඳහා ගොනුවල අඩුපාඩු සකසා එවීමට ගොනු යවා ඇත.<br>තැපැල් කාර්යාල 03 ක අලාභ හානි කපාහැරීම අනුමත වී ඇති අතර,. මුදල් වංචා, සොරු බිදීම් ආදිය ඇතැම් අලාභවල ඇතුලත්ව ඇති හෙයින් ඒවායේ නඩු හා පරීක්ෂණ අවසන්ව නොමැතිවීම අලාභය කපා හැරීම සඳහා ප්‍රමාද වීමට හේතු වී ඇත. | හානි හා පාඩු සම්බන්ධයෙන් සුදුසු පරිදි ක්‍රියා කළ යුතුය. |

### 3.2 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කිලෝවොට් 500 ක ධාරිතාවයෙන් යුත් විදුලි උත්පාදක යන්ත්‍රයේ නඩත්තු කටයුතු සඳහා 2020 වර්ෂයේ මාස 06 ක කාලයකට විදුලිබල මණ්ඩලය සමඟ සේවා ගිවිසුමක් අත්සන් කර තිබූ නමුත් කිසිදු සේවා කිරීමක් සිදුකර නොතිබුණි. | කිහිප වතාවක්ම ලංකා විදුලි බල මණ්ඩලය දැනුවත් කළ ද අදාළ සේවා කිරීම් සඳහා ද ඔවුන් පැමිණ නැති බව දන්වා සිටිමි. | සේවා ගිවිසුම අනුව සේවා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි තක්සේරු කිරීම් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු නොකළ තැපැල් කාර්යාල ගොඩනැගිලි සංඛ්‍යාව 06 ක් හා පිඹුරුපත් නොමැතිකම නිසා යොමු නොකළ තැපැල් කාර්යාල සංඛ්‍යාව 12 ක් විය. | දොළොස්බාගේ, දිවුල්දමන, මල්වත්ත, නෙලුම් වැව, වතුරාව හා ගෝණවිල තැපැල් කාර්යාලයන්හි අදාල ඉඩම්වල පිඹුර සහ පැවරීම් සහතික පමණක් පවතින අතර ඒවා ඉඩම්වල තක්සේරු වටිනාකම් ලබා ගැනීමට 2020.09.07 දින තක්සේරුවට යවා ඇත. 2019 වසරේ දෙපාර්තමේන්තුවට පවරාගෙන ඇති මෙම තැපැල් හා උප තැපැල් කාර්යාල රජයේ ගොඩනැගිලි වන අතර ඒවායේ ගොඩනැගිලි සැලසුම් නොමැති බැවින් සැලසුම් නැවත සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. එසේම තැපැල් හා උප තැපැල් කාර්යාල වල පිඹුරු පත් ඉදිරිපත් කරන ලෙස ප්‍රාදේශීය තැපැල් අධිකාරී කාර්යාල දැනුවත් කරමින් 2019.09.03 ලිපි යවා ඇති අතර එම කාර්යයන් සිදු වෙමින් පවතී. | දෙපාර්තමේන්තුව සතු සියළුම ගොඩනැගිලි තක්සේරු කරගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ තැපැල් හා උපතැපැල් කාර්යාල 16 ක ඉඩම් පවරා ගැනීම් හා මැනීම් කටයුතු සඳහා රු.762,480 ක් වැය කර තිබූ නමුත් 2021 මාර්තු 15 දින වන විටත් එම ඉඩම් පවරා ගැනීමේ කටයුතු අවසන් වී නොතිබුණි. | මිනින්දෝරු දෙපාර්තමේන්තුවට මුදල් ගෙවා ඇතත් පසුගිය වසර තුළ පැවති කෝවිඩ් වසංගත තත්වයන් නිසා මැනුම් කටයුතු නිසි වේලාවන් තුළ සිදු නොකිරීම මෙම තත්වයට හේතු වී ඇත. මැනුම් කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට උපදෙස් ලබා දී ඇත. | කඩිනමින් ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | තැපැල්පති නමින් ලියාපදිංචි කර ඇති වාහන සම්බන්ධයෙන් තැපැල් දෙපාර්තමේන්තුවෙන් හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු සැසඳීමේදී වාහන 87 ක් සම්බන්ධ තොරතුරු දෙපාර්තමේන්තුව සතුව නොතිබුණු අතර අංක 60 ශ්‍රී 7256 දරන බස් රථය භාවිතයෙන් ඉවත්කර තිබුණද ඒසඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි. | වර්ෂ 1956 සිට වර්ෂ 2001 දක්වා ලියාපදිංචි කරන ලද වාහන 87 න් වාහන 20 ක පමණක් තොරතුරු සොයාගත් අතර ඉතිරි වාහනවල තොරතුරු දෙපාර්තමේන්තුව සතුව නොමැති බවද මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් වාහනවල අයිතිය සම්බන්ධව තහවුරුවක් පමණක් ලබා දී ඇත.<br>තාවකාලිකව ලද වාහන 03 ක් 2020.09.03 වන දින නැවත එම අමාත්‍යාංශය වෙත භාරදී ඇත.<br>බස්රථය අපහරණය කිරීම සඳහා වැසි අංකය නොගැලපීම හේතුවෙන් තක්සේරු දෙපාර්තමේන්තුව වාහනය තක්සේරු නොකල නිසා අපහරණය කිරීමට නොහැකි විය. | තැපැල් දෙපාර්තමේන්තුවේ නමට ලියාපදිංචි වී ඇති වාහන පිළිබඳව නිවැරදි තොරතුරු දෙපාර්තමේන්තුවේ පැවතිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව මුද්දර තොග ලේඛනවල ශේෂය හා භෞතික මුද්දර ශේෂය අතර රු.379,187 ක මුද්දර 41 ක අතිරික්තයක්ද රු.590,430 ක මුද්දර 250 ක ඌනතාවයක් ද පැවතුනි. | 2020 දෙසැම්බර් 21 දිනට මුද්දර හා ඒ ආශ්‍රිත තොග අත දරන නිලධාරීන් 8 දෙනෙකුගේ තොගයන්ට අදාළව හිඟයන් හා අතිරික්තයන් පවතී. මේ වන විට එම අතිරික්තයන් සහ ඌනතාවයන් පියවීමට අදාළව දැනුවත් කිරීම් කටයුතුද සිදුකර ඇත. එම නිලධාරීන් බහුතරය බස්නාහිර පළාතෙන් පිටත පදිංචි අය බැවින් සංචරණ සීමා නිසා කටයුතු සම්පූර්ණ කිරීමට ප්‍රමාද වී ඇත. අදාළ කටයුතු සිදුකර විගණනයට වාර්තා කිරීමට කටයුතු කරමි. | ඌනතා අතිරික්තතා ඇති නොවන පරිදි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ඇතිකිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසානයට නාරාහේන්පිට මුද්දර අංශයේ, අලෙවිය සඳහා නුසුදුසු භාවිතයට නොගන්නා වටිනාකම රු.1,782,317 ක් වූ මුද්දර මුද්‍රිත ලිපිද්‍රව්‍ය තොගය දීර්ඝ කාලයක් ගබඩාවේ පැවතියද මේ සම්බන්ධයෙන් මු.රෙ 350 (4) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම රු.1,782,317 ක් වූ මුද්දර මුද්‍රිත ලිපිද්‍රව්‍ය තොගය සම්බන්ධව මු.රෙ. 350(4) ප්‍රකාරව කටයුතු කිරීමට මහා භාණ්ඩාගාර නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇත.අදාළ කමිටුව විසින් අවසන් වාර්තාව ඉදිරිපත් කළ පසුව මු.රෙ.350(4) ප්‍රකාරව කටයුතු කරමි. | මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසානයට නාරාහේන්පිට මුද්දර අංශයේ මුද්දර පාලන ලෙජරය හා භෞතික ශේෂය අතර රු.2,476,800 ක් වටිනා මුද්දර තොගයක ඌනතාවයක් පැවතුණි. | මෙම ඌනතාවය අවස්ථා ගණනකදී ඇතිවී තිබෙන ඌනතාවයන්ය. මෙම සම්බන්ධව සෑම වර්ෂයකම මහා භාණ්ඩාගාර සමීක්ෂණ මණ්ඩලයේ විමසීමට ලක් වන බැවින් විමර්ෂණයක් සිදු කරන ලෙස පාලක විමර්ෂක වෙත නියෝග කර ඇත. විමර්ෂණ වාර්තාව අනුව මෙම ඌනතා 1984 සිට වරින් වර ඇතිවූ ඌනතා වන අතර ඒ සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් සම්බන්ධ බවට කරුණු අනාවරණය නොවීය. එසේම මෙම ඌනතාවයන් වංචාවක්, සොරකමක් හේතුවෙන් ඇතිවූ ඌනතා නොවන අතර ගණන් බැලීමේදී ඇතිවූ ඌනතාවයන් බව සඳහන් විය. මෙම මුද්දර මුද්‍රණය වසර 10 කටත් පෙර සිදුවූ මුද්‍රණයන් බැවින් අදාළ මුද්‍රණ සමාගමෙන් එම ඌනතාවයන් අය කර ගැනීමට නොහැකි නිසා ඌනතාවය කපා හැරීමට නිර්දේශ කර ඇත. ඒ සඳහා සියළු කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී. | ලේඛනවල තොගය භෞතික තොගය සමඟ සැසඳිය යුතුවේ. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | තැපැල් දෙපාර්තමේන්තුවේ අනෙකුත් ශ්‍රේණි හා සේවාවල 1,965 ක් පුරප්පාඩු පැවති අතර ජ්‍යෝෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 61 ඊට ඇතුළත් වී තිබුණි. එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පූර්ණ අනුමැතිය නොලැබීම, සුදුසුකම් සම්පූර්ණ කල නිලධාරීන් ප්‍රමාණවත් ලෙස නොසිටීම, නඩු පැවරීම වැනි කරුණු මේ සඳහා හේතු වී ඇත. ජ්‍යෝෂ්ඨ මට්ටමේ තනතුරු 03 ක් සඳහා නිලධාරීන් තිදෙනෙකු බඳවාගෙන ඇත. තෘතීයික මට්ටමේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට බඳවා ගැනීම් පටිපාටිය සංශෝධනය කරමින්පවතී. ද්විතීයික මට්ටමේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට සඳහා අනුමැතිය ලැබී ඇති අතර ඊට අවශ්‍ය කටයුතු සිදුකර ඇති නමුත්, ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් මත අදාල කටයුතු නවතා ඇත. අනෙකුත් පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් පවතී. උප තැපැල් ස්ථානාධිපති පුරප්පාඩුවල වැඩ බැලීම සඳහා උප තැපැල් ස්ථානාධිපතිවරයෙකු යොදවනු ලබයි. ප්‍රාථමික මට්ටමේ තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් පවතී. | පුරප්පාඩු සම්පූර්ණ කර දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂම හා ඵලදායී කරගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අංක DMS/1139/VI හා 2016 ජූලි 07 දිනැති ලිපියෙන් සහකාර තැපැල් අධිකාරී තනතුරු ප්‍රමාණය 106 කින් වැඩිකිරීමට අනුමැතිය ලබා දී තිබුණද එම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ලබා දී ඇති MN-07 ශ්‍රේණියේ තනතුරු 106 ක් සඳහා බඳවා ගැනීම් පටිපාටිය සංශෝධනය කිරීමට සිදුව ඇත. ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් පවතී. | අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීම් කඩිනමින් සිදුකළ යුතු වේ. |